ඉතාලිය

# මගේ ඇඟිලි සලකුණු සහ ඡායාරූපය අවශ්‍ය වන්නේ ඇයි?

F ප්‍රකාරය

**ජාතික නැවත පදිංචි කරවීමේ හෝ මානුෂීය ඇතුළත් කිරීමේ වැඩසටහනක් යටතේ නැවත පදිංචි කරවන ලද පුද්ගලයින්**



SINHALESE

## මට මෙම විස්තර පත්‍රිකාව ලැබෙන්නේ ඇයි?

ජාතික නැවත පදිංචි කරවීමේ හෝ මානුෂීය ඇතුළත් කිරීමේ යෝජනා ක්‍රමයක් යටතේ ඔබට EU+ රටකට ඇතුළු වීමට අවසර ලබා දී ඇත.

මෙම විස්තර පත්‍රිකාව බලධාරීන් විසින් ගබඩා කරගනු ලබන දත්ත පිළිබඳ ව සහ ඒ කොපමණ කාලයක් සඳහා ද යන්න පිළිබඳ ව වැඩිදුර තොරතුරු ලබා දෙයි.

## මට මගේ ඇඟිලි සලකුණු සහ ඡායාරූපය ලබා දීමට සිදුවන්නේ ඇයි?

මේ රටේ බලධාරීන් ඔබේ ඇඟිලි සලකුණු සහ ඡායාරූප ලබා ගනු ඇත. මෙම දත්ත, ඔබේ අනන්‍යතාවය පිළිබඳ ව තොරතුරු සහ අනෙකුත් අදාළ තොරතුරු සමඟ යුරෝඩැක් දත්ත සමුදාය වෙත සම්ප්‍රේෂණය කෙරෙනු ඇත.

යුරෝඩැක් EU+ රටක ජාතිකයන් නොවන ඇතැම් කාණ්ඩවල පුද්ගලයින්ව ඔවුන්ගේ අනන්‍ය ඇඟිලි සලකුණු සහ ඡායාරූප කට්ටලය හා සම්බන්ධ කරයි.

මෙම දත්ත සමුදාය EU+ රටවල් 31ක් විසින් භාවිත කරනු ලබන අතර ඔවුන්ට ඔබේ තොරතුරු ලබාගැනීමට ඔබේ දත්ත සැකසීමේ හැකියාව ඇත. EU+ රටවල් මෙම විස්තර පත්‍රිකාව අවසානයේ ලැයිස්තුගත කර ඇත.

## යුරෙෝඩැක්හි ගබඩා කර ඇති තොරතුරු මොනවාද?



පහත සඳහන් තොරතුරු සැමවිටම ගබඩා කෙරේ:

- ඔබේ ඇඟිලි සලකුණු
- ඔබේ මුහුණේ ඡායාරූපයක්
- ඔබ දැන් භාවිත කරන හෝ අතීතයේ භාවිත කර ඇති සියලුම නම්
- ඔබ දැන් භාවිත කරන හෝ අතීතයේ භාවිත කර ඇති සියලුම උපන් දින
- ඔබේ උපන් ස්ථානය
- ඔබේ ජාතිකත්වය හෝ ජාතිකත්වයන්
- ඔබේ ස්ත්‍රී පුරුෂභාවය
- ඔබ භාවිත කර තිබෙන අනන්‍යතා හෝ සංචාරක ලේඛනවල පිටපත්, තිබේ නම්, ඒවායේ සත්‍යතාව පිළිබඳ ව තොරතුරු ඇතුළුව
- ඔබේ ඇඟිලි සලකුණු සහ ඡායාරූපය ලබාගත් නිලධාරියාගේ පරිශීලක හැඳුනුම සහ ඔබේ දත්ත ලබාගෙන සම්ප්‍රේෂණය කළ දිනයන්
- ඔබ ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා ඉල්ලුම් කළ රට
- ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා ඉල්ලුම් කළ දිනය.

අවශ්‍ය විටෙක පහත තොරතුරු ද යුරෙෝඩැක්හි ගබඩා කරනු ඇත:

- ඔබේ අයදුම්පත පරීක්ෂා කිරීමට වගකිව යුතු රට
- ඔබ නැවත පදිංචි කරවා ඇත්නම්, නැවත පදිංචි කරවන ලද EU+ රට
- ඔබේ අයදුම්පත ප්‍රතික්ෂේප වී තිබේ නම් සහ ඔබට EU+ රටවල රැඳී සිටීමේ අයිතිය නොමැති නම්
- ඔබේ අයදුම්පත දේශසීමා ක්‍රියාපටිපාටිය යටතේ සලකා බලා ප්‍රතික්ෂේප කර ඇත්නම් හෝ ඔබේ අයදුම්පත ඉල්ලා අස්කර ගත් අයදුම්පතක් සලකන්නේ නම්
- EU+ රටක් විසින් ඔබට නිකුත් කරන ලද ඕනෑම වීසා බලපත්‍රයක් පිළිබඳ තොරතුරු
- ඔබ EU+ රටවල කලාපයෙන් පිටව ගිය ඕනෑම වේලාවක තොරතුරු
- ඔබ ස්වේච්ඡාවෙන් ඔබේ මව් රටට ආපසු යාමට ඉදිරිපත් වූ යෝජනාවක් පිළිගනු ලැබුවේ ද යන්න පිළිබඳ තොරතුරු.

යුරෙෝඩැක්හි ගබඩා කර ඇති සාවද්‍ය තොරතුරු වෙත ප්‍රවේශ වීමට සහ සංශෝධනය කිරීමත් එය නීති විරෝධී ලෙස හසුරුවා ඇත්නම් ඔබේ තොරතුරු මකා දැමීමට ඉල්ලා සිටීමත් ඔබට අයිතිය ඇත. මෙය සිදු කිරීම සඳහා ඔබට දත්ත පාලකය සම්බන්ධ කර ගත හැකිය. දත්ත පාලකයේ සම්බන්ධතා තොරතුරු **'යුරෙෝඩැක් පිළිබඳ ව ඔබ දැනගත යුතු දේ'** යන විස්තර පත්‍රිකාවෙන් සොයාගත හැකිය.

## මගේ පුද්ගලික දත්ත යුරෝඩැක්හි කොපමණ කාලයක් ගබඩා කර තිබෙනු ඇති ද?



ඔබේ තොරතුරු වසර 5ක් ගබඩා කර තබාගෙන පසුව ස්වයංක්‍රීයව මකා දමනු ඇත.

මෙම කාල සීමාව ඉකුත්වීමට පෙර ඔබ EU+ රටක පුරවැසිභාවය ලබා ගන්නේ නම්, ඔබේ දත්ත මකා දැමෙනු ඇත. ඔබේ දත්ත මකා දැමුවහොත්, ඔබ පුරවැසිභාවය ලැබූ රටෙහි ඔබේ තත්ත්වයට මෙය බලපාන්නේ නැත.

**ඔබ දැන් ඉතාලිය හි සිටින අතර, එය EU+ රටකි.**
**EU+ රටවල් වන්නේ:**

යුරෝපීය සංගමයේ (EU) සාමාජික රටවල් 27: ඔස්ට්‍රියාව, බෙල්ජියම, බල්ගේරියාව, ක්‍රොඒෂියාව, සයිප්‍රසය, චෙකියාව, ඩෙන්මාර්කය, එස්තෝනියාව, ෆින්ලන්තය, ප්‍රංශය, ජර්මනිය, ග්‍රීසිය, හංගේරියාව, ඉතාලිය, ලැට්වියාව, ලිතුවේනියාව, ලක්සම්බර්ග්, මෝල්ටාව, නෙදර්ලන්තය, පෝලන්තය, පෘතුගාලය, අයර්ලන්ත ජනරජය, රුමේනියාව, ස්ලෝවැකියාව, ස්ලෝවේනියාව, ස්පාඤ්ඤය, ස්වීඩනය සහ

අනෙකුත් රටවල් 4: අයිස්ලන්තය, ලීච්ටන්ස්ටයින්, නෝර්වේ, ස්විට්සර්ලන්තය.

මෙම සටහන දැනගැනීමේ අරමුණු සඳහා පමණි. එමඟින් අයිතීන් හෝ වගකීම් නිර්මාණය නොකරයි. මෙම සටහනේ අන්තර්ගත තොරතුරු මඟින් නිර්මාණය කළ හැකි යම් භාවිතයක් සඳහා EUAA හෝ EUAA වෙනුවෙන් ක්‍රියා කරන කිසිදු පුද්ගලයෙකු වගකිව යුතු නොවේ.

© European Union Agency for Asylum, 2025